**<u>මහර ප්‍රාදේශීය සභාව</u>**

**<u>ගම්පහ දිස්ත්‍රික්කය</u>**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 30 දිනද ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජූලි 22 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

---------------------------------

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට මහර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

1.3.1 **<u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ගම නගා සිටුවීමේ වැඩ සටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති 2 කට අදාළ ණයහිමි වෙන්කිරීමේදී රු.563,700 ක් අඩුවෙන් වෙන්කිරීම් කර තිබුණි.

(ආ) 2014 වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දී තිබූ ගිණුම්කරණ අඩුපාඩු 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදීද නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගත් ට්‍රැක්ටර් ට්‍රේලර් දෙක ලියාපදිංචි කිරීම සඳහා දරන ලද රු.42,000 ක මුදල ප්‍රාග්ධන ගත කර නොතිබුණි.

(ඇ) සභාව සතු ඉඩම් කොටස් 19 ක් වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට සහ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) කැන්දලියද්ද පාළුව පොල්හේන ආදාහනාගාරය ඉදිකිරීම පිළිබඳව ගිණුම්ගත කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) කොන්ත්‍රාත්කරුට ගෙවියයුතු රු.3,514,777 ක මුදල සඳහා සමාලෝචිත වර්ෂයේදී ණයහිමියන් ලෙස රු.6,500,000 ක් වෙන්කර තිබීම නිසා ණයහිමි ගිණුම් රු.2,985,223 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ පොල්හේන ආදාහනාගාරය ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් රු.7,170,000 ක ණය මුදලක් ලැබී තිබූ අතර, මෙම ණය මුදල දිගු කාලීන බැරකම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(iii) පොල්හේන ආදාහනාගාරය ඉදිකිරීම සඳහා දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලැබුණු රු. 7,170,000 ක මුදල සහ රු. 6,500,000 ක ඉතිරි ඇස්තමේන්තු ගත මුදල් එකතුව

රු.13,670,000 ක් ආදායම් හා වියදම් ගිණුමේ සෞඛ්‍ය සේවා යටතේ ප්‍රාග්ධන වත්කම් විකුණුම් ලෙස බැරකර තිබුණි.

(iv) පොල්හේන ආදාහනාගාරය ඉදිකිරීම වෙනුවෙන් රු.6,500,000 ක් හිඟ හිටි ගිණුම හර කොට ණය ගිණුමට බැර කිරීම හේතුවෙන් එම ගිණුම් දෙක එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) දේශීය ණය හා සංවර්ධන අරමුදල සඳහා 2015 ජූනි , ජූලි මාස සඳහා ගෙවන ලද රු.29,050 ක පොලී ගිණුම් ගත කර නොතිබුණි.

(උ) බස්නාහිර පළාත් සභාවේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වැටුප් ප්‍රතිපූර්ණය මගින් අයකර ගැනීමේ පදනම යටතේ ලබාගත් කැබ් රථය සඳහා සමාලෝචිත වර්ෂයේ අයකර ගෙන තිබූ රු.1,059,409 ක් මෝටර්රථ ගිණුමට ප්‍රාග්ධන ගත කර නොතිබුණි.

(ඌ) 2001,2002, 2003 සහ 2004 යන වර්ෂවලට අදාළ ලී බඩු හා සවිකිරීම් වටිනාකම පිළිවෙලින් රු.613,404 ක් රු.36,964 ක්, රු.113,805 ක් සහ රු.48,220 ක්වූ එකතුව රු.812,393 ක් ලී බඩු හා සවි කිරීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පහළ කරගහමුණ උප කාර්යාලයේ රු.56,255 ක් වූ ලී බඩු හා සවි කිරීම් වටිනාකම ගිණුම්වල දක්වා නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ උප කාර්යාල 3 ක් සඳහා මිලදී ගත් රු.1,479,938 ක් වූ පුස්තකාල පොත් මහර උප කාර්යාල යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඔ) සේවක අර්ථ සාධක අරමුදල් සම්බන්ධයෙන් රු.57,415 ක අධිභාරයක් පනවා තිබූ අතර, සමාලෝචිත වර්ෂයේදී රු.19,956 ක් ගෙවීම් කර තිබුණි. ඉතිරි රු.37,459 ක ගෙවිය යුතු මුදල වෙනුවෙන් ණයහිමි වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.35,160,810 වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 <u>බැංකු ගිණුම්</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ එකතුව රු.1,064,463 ක්වූ චෙක්පත් 117 ක් පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2013,2014 වර්ෂවලදී බැංකුවට සෘජුවම ලැබුණු රු.253,302 ක මුදලක් හඳුනාගෙන නොතිබුණු අතර එම ශේෂයන් දිගින් දිගටම බැංකු සැසඳුම් ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් තිබුණි.

(ඇ) එකතුව රු.16,178 ක් වූ ශේෂයන් 3 ක් දිගින් දිගටම බැංකු සැසඳුමේ ඉදිරියට ගෙන එමින් පැවති අතර ඒවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දින වන විට රු.26,336 ක අගරු චෙක්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි ආදායම රු.17,194,642 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.41,650,401 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

මහර ප්‍රාදේශීය සභාවේ පළාත් පාලන ධූර කාලය 2015 මැයි 15 දින සිට අවසන් කර තිබුණි. එදින සිට සභාවේ බලතල ක්‍රියාත්මක කිරීමට සුදුසු ලෙස පරිපාලන ව්‍යුහයක් ආයතනය තුළ ක්‍රියාත්මක කරන ලෙස 2015 මැයි 22 දිනැති බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/05/02/03 දරන ලිපිය මගින් සභාවේ ලේකම් වෙත දන්වා තිබුණි.එසේ වුවද, ගෙවීම් වවුචර් සඳහා බලය ලබා දීම, වියදම සහතික කිරීම හා අනුමත කිරීමේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු ආකාරයේ ක්‍රමවේදයක් සඳහා වූ පරිපාලන ව්‍යුහයක් ආයතනය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. 2015 මැයි මාසයේ සිට සභාවේ සියළුම වියදම් සම්බන්ධයෙන් වියදම සහතික කිරීම සහ අනුමත කිරීමේ කාර්යය ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 135 සිට 139 දක්වා වූ විධිවිධානවලට පටහැනිව සභා ලේකම් විසින්ම සිදුකර තිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 4,443 | 5,236 | 7,686 |
| බදු කුලී | 3,555 | 3,610 | 549 |
| වෙළඳ බලපත්‍ර ගාස්තු | 1,328 | 1,281 | 468 |
| වෙනත් ආදායම් | 601 | 733 | 6 |

#### 2.3.2 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ඌරුවල් පේරුව උප කාර්යාලයේ අවසන් වරට වරිපනම් දේපල තක්සේරු කර තිබුණේ 1968 වර්ෂයේදීය. වසර 47 ක් ඉක්මවා ගියද නව ප්‍රතිශෝධනයක් කර නොතිබුණ අතර, නව වරිපනම් දේපල හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි.1968 වර්ෂයේ සිට පැවත එන වරිපනම් ඒකක 140 කින් පමණක් 2015 වර්ෂය දක්වා වරිපනම් බදු අයකර තිබූ අතර මේ හේතුවෙන් මෙම උප කාර්යාලයේ වරිපනම් බදු ආදායම් ඉතා අඩු අගයක් ගෙන තිබුණි. වසරින් වසර ගොඩනැගිලි

සැලසුම් අනුමත කර ඇතත් ඒ අනුව නව වරිපනම් ඒකක හඳුනා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට රු.7,396,886 ක්වූ හිඟ වරිපනම් ශේෂය තුළ වර්ෂ 10 ට වැඩි රු.3,045,803 ක ශේෂයක්ද, වර්ෂ 5-10 අතර රු.2,048,070 ක ශේෂයක්ද, වර්ෂ 1-5 අතර රු.1,895,821 ක ශේෂයක්ද විය. එම හිඟ ශේෂයන් අයකර ගැනීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ විධිවිධාන පරිදි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයම දියුණු ප්‍රදේශයක් වශයෙන් නම්කර ඇතත් වරිපනම් ඒකකවල වර්ධනයක් සිදුවී නොමැති බව නිරීක්ෂණය විය.

2.3.3 <u>වෙළඳ බලපත්‍ර</u>

ආදායම් පාලක විසින් ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණය අනුව හිග වෙළඳ බලපත්‍ර ශේෂය තුළ 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂ 10 ඉක්මවූ රු.15,220 ක ශේෂයක්ද, වර්ෂ 1-5 අතර කාලයට අයත් රු.311,870 ක හිග ශේෂයක්ද පැවති අතර අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

2.3.4 <u>සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුළ ඇති සම්ප්‍රේෂණ කුළුණු පිළිබඳ පරීක්ෂණයක් සිදුකර ඒවා හඳුනාගෙන 2009 අප්‍රේල් 17 දිනැති අංක 15971/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය පදනම් කර ගනිමින් අතුරු ව්‍යාවස්ථාවක් මගින් අයකළ යුතු ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට සම්ප්‍රේෂණ කුළුණු 15 ක් හඳුනාගෙන ඇතත් ඒවායෙන් අදාළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>**

**3.1 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>**

කසළ බැහැර කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය පරිපාලකවරයෙකුගේ අධීක්ෂණයක් සිදු කෙරෙන අවස්ථාවකදී කසළ ඇදීමේ කටයුතු නිරීක්ෂණය වෙනුවෙන් වැඩ ක්ෂේත්‍ර කම්කරුවකු යොදවා තිබූ අතර ,ඒ සඳහා 2015 වර්ෂයේදී රු.72,000 ක යතුරු පැදි ඉන්ධන වියදමක්ද රු.80,064 ක අතිකාල වියදමක්ද දරා තිබුණි. කසළ අපහරණ කටයුතු අධීක්ෂණය සෞඛ්‍ය පරිපාලකගේ රාජකාරී කටයුත්තක් වන බැවින් හා සභාවේ සේවකයෙක් යොදා ගැනීමට අවශ්‍ය නොවන බැවින් මෙම වියදම ආර්ථික නොවන වියදමක් බව නිරීක්ෂණය විය.

3.2 <u>අවිධිමත් ගනුදෙනු</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2014 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන ව්‍යාපෘති වලට අදාළව අමතර රාජකාරි ඉටුකිරීම වෙනුවෙන් පරිපාලන වියදම් ලෙස ලැබුණු රු.822,671 න් සභාවේ ලේකම්වරයා සහ අනෙකුත් කාර්ය මණ්ඩල සේවකයින් 45 දෙනෙකුට රු.803,000 ක් ගෙවා තිබුණි. ගෙවීම් කිරීමට අදාළව නිවාඩු දින රාජකාරි ඉටුකිරීම පිළිබඳ පූර්ව අනුමැතිය, පරිපාලන වියදම ගණනය කිරීමට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුණි.මෙම ගෙවීමට අදාළ සේවකයින්ගේ නියැදියක් ගෙන ඔවුන්ගේ පැමිණීමේ වාර්තා පිළිබඳව කරන ලද පරීක්ෂාවට අදාළව ඔවුන් අමතර රාජකාරි ඉටුකිරීම පැය 245.45 ක් වූ බවත් ඒ අනුව ගෙවියයුතු මුදල රු.28,661 ක් වුවත් රු.324,500 ක් ගෙවා ඇති බවත් නිරීක්ෂණය විය.

(ආ) 1996 දෙසැම්බර් 27 දිනැති අංක එල්පී/95/46 දරන බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ චක්‍රලේඛයේ 04 (iii) ඡේදය ප්‍රකාරව සභාවේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ පෞද්ගලික කාර්යයන් සඳහා කිසිම අවස්ථාවක වාහන පාවිච්චි නොකළ යුතු බව දැක්වෙතත් සභාවේ ලේකම්වරයා විසින් සභාවේ වාහනය යොදවා ගෙන නිවාස හා කාර්යාලය අතර යාම ඒම වෙනුවෙන් සැම දිනකම කිලෝ මීටර් 122 ක් ධාවනය කර තිබුණි.නියැදි පරික්ෂාවේදී 2015 ජූලි 08 සිට 2015 අගෝස්තු 13 දක්වා වූ ධාවන සටහන් අනුව නිවසට යෑම් ඊම් සඳහා කිලෝමීටර් 3172 ක් ධාවනය කර තිබූ අතර ඒ සඳහා සභා අරමුදලින් ඉන්ධන වෙනුවෙන් රු.40,782 ක වියදමක් දරා තිබුණි.

(ඇ) 2010 සැප්තැම්බර් 09 දිනැති අංක පීඑල්/එම්/01/05/26 දරන පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ වැඩබලන ලේකම්වරයාගේ ලිපියේ සඳහන් පරිදි පළාත් පාලන ආයතන ප්‍රධානියෙකු, නියෝජ්‍ය ප්‍රධානියෙකු හෝ සභිකයෙකු විදේශ පුහුණු වැඩසටහනක් සඳහා තෝරා ගත්තේ නම් අදාළ සංවිධානය හෝ විදේශ ආයතනය හෝ විදේශ රාජ්‍යය හෝ ඒ සඳහා වැයවන සියළු වියදම් සහ පහසුකම් දැරියයුතු බවත් ඒ සඳහා රජයේ හෝ පළාත් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ මුදල් නොයෙදවියයුතු බවත් දන්වා තිබුණි. එම උපදෙස් වලට පටහැනිව සභාව විසින් ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය මගින් සංවිධානය කරනු ලබූ වියට්නාමයේ පැවති පළාත් පාලන ආයතන පිළිබඳ නිරීක්ෂණ හා පුහුණු වැඩසටහනකට සහභාගීවීම වෙනුවෙන් සභිකයෙකුට රු.160,000 ක් ගෙවීම් කර තිබුණි.

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පොදු පහසුකම් සඳහා වෙන්කර ඇති ඉඩම් කොටස් තුනකට අදාළව එකතුව රූඩ් 2 පර්චස් 8.18 ක ඉඩම්වල ඔප්පු විගණිත දිනය වූ 2016 මැයි 02 දින වන විටත් ලබාගෙන නොතිබුණු අතර, ඔප්පු නොමැති වීම නිසා ස්ථාවර වත්කම් ලේඛනවලටද ඇතුළත් කර නොතිබුණි.

(ආ) ඌරුවල්පේරුව උප කාර්යාලයට අයත් පුස්තකාල පහෙන් හේනේගම, විළිඹුල හා නීල මහර යන පුස්තකාල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.349,938 ක් වටිනා පොත් මිලදී ගෙන තිබුණද, මෙම පුස්තකාලවල පාඨක සංඛ්‍යාව වැඩිකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි.

(ඇ) 1990 සිට 2012 දක්වා විශ්‍රාම ගිය නිලධාරීන් 14 දෙනෙකුට සභාව විසින් රු.985,649 ක තාවකාලික විශ්‍රාම වැටුපක් ගෙවා තිබුණද, එම මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. සභාවේ ගිණුම් අනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල්ට ගෙවිය යුතු රු.41,201 ක ණයහිමි ශේෂයක් පැවති අතර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂක ජනරාල් දෙපාර්තමේන්තුවේ ගිණුම් අනුව එම ශේෂය රු.245,078 ක් විය.

(ඈ) ඌරුවල්පේරුව උප කාර්යාල බල ප්‍රදේශය තුළ (1989 භීෂණ සමයේදී ගිනි තබා විනාශ කරන ලද කඩ කාමර ) දේපලක් වෙනුවෙන් බිල් කිරීම් හේතුවෙන් රු.377,600 ක හිඟ ශේෂයක් පැවති අතර මෙය නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පහත පරිදි විය.

| | අනුමත | තථ්‍ය | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 04 | 04 | - |
| තෘතියික | 01 | 01 | - |
| ද්විතියික | 52 | 51 | 01 |
| ප්‍රාථමික | 96 | 91 | 05 |
| | 153 | 147 | 06 |

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1898 අංක 01 දරන විශ්‍රාම වැටුප් අරමුදල් ආඥා පනත හා 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සියළුම සේවකයින් දායක වියයුතු අතර, සභාව විසින්ඒ සඳහා ලිපිලේඛන යොමුකර අදාළ අංකය ලබා ගැනීමෙන් පසු මාසික දායක මුදල් යැවීමට කටයුතු කළ යුතු වුවත් , සේවකයින් 73 දෙනෙකු සම්බන්ධයෙන් අංක ලබා ගැනීමකින් තොරව රු.960,188 ක දායක මුදල් විශ්‍රාම වැටුප් අරමුදලට යවා තිබුණි.

(ආ) 2010 මැයි 26 දිනැති අංක 4/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛයේ 3 වැනි වගන්තිය ප්‍රකාරව තාවකාලික,කොන්ත්‍රාත්, දෛනික වැටුප් ලබන විශ්‍රාම වැටුප් අහිමි සේවකයින් සඳහා රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු වුවත් 2014 වර්ෂයේ ජූලි මාසයේ සිට 2015 වර්ෂය දක්වා සභාවට බඳවා ගන්නා ලද සායන භාරකරුවන් 5 දෙනෙකු සඳහා රු.270,000 ක වැටුප් ගෙවා ඇතත් මෙම විධි විධාන අනුව කටයුතු කර නොතිබුණි.

## 3.5 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභා බල ප්‍රදේශය තුළ ජනනය වන කසල අපහරණය සඳහා පුද්ගලික සමාගමක් සමග මාස 6 න් 6 ට ගිවිසුමකට එළඹ තිබූ අතර, එම ගිවිසුමට ප්‍රමාණවත් කොන්දේසි ඇතුළත් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ සභාව විසින් කසල අපහරණය වෙනුවෙන් රු. මිලියන 13.9 ක් වැයකර තිබුණි.

(ආ) ඝන අප ද්‍රව්‍ය කළමනාකරණ පිළිබඳව 2011 ජූලි 05 දිනැති අංක 1713/11 දරන ශ්‍රී ලංකා ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ IV (අ) කොටසේ ඝන අප ද්‍රව්‍ය කළමනාකරය පිළිබඳ අතුරු ව්‍යවස්ථා 22 වගන්තිය ප්‍රකාරව සඳහන් කර ඇති කාර්යයන් සැලසුම් කිරීම්, අධීක්ෂණය කිරීම සහ පාලනය කිරීම කෙරෙහි සභාව විසින් නිසි පියවර නොතිබුණි.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු  කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) කොන්ත්‍රාත් පාලනය
(ඉ) සන අපද්‍රව්‍ය කළමනාකරණය
(ඊ) වත්කම් කළමනාකරණය
(උ) තොග පාලනය